mtgujnyhyxtyjt

# පුදුමාකාර දොරටුව



කේ. ඒ. දිනිති විහාරා දේවප්‍රිය

# පුදුමාකාර දොරටුව

**කේ. ඒ. දිනිති විහාරා දේවප්‍රිය**

කතෘ

කතෘගේ වෙනත් කෘති: **කම්මැලි කහ කිරිල්ලිට පාඩමක්**

මහ/ මහමායා බාලිකා විද්‍යාලය

10 ශ්‍රේණිය B

2026 මැයි මස 10

ISBN No:978-624-211-275-6

# පිදුම

*අම්මාටයි තාත්තාටයි*

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. ලියවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කරවූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මඟ පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුද කරමු.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# <u>සුභාශිංසන පණිවුඩය</u>

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එදා අපි ලොකු අම්මලාගේ ගෙදර ගියේ පාසල් නිවාඩු ලැබී තිබු හෙයිනි. අපි ලොකු අම්මලා දිහාට ළඟා වන විට සවස් යාමය එළඹී තිබිණි. ලොකු අම්මා, ලොකු අප්පච්චි සහ යසස් අයියා අප පිළිගැනීමට නොඉවසිල්ලෙන් මඟ බලා සිටියහ. අපි යනවිට පුංචි අම්මලා ද එහි ඇවිල්ලා සිටියහ. හුඟක් රෑ බෝ වූ නිසා අපි සියල්ලෝම රාත්‍රී ආහාරය ගත්තෙමු. ආහාර ගැනීමෙන් පසු මා ඇතුලු එහි පැමිණ සිටි සහෝදර සහෝදරියෝ එක්ව සතුටු සාමිච්යේ යෙදුණේ අප සියල්ලන් එකට හමු වුයේ ගොඩ කාලයකට පසුව බැවිනි. ඉන්පසු අප පොතක් කියවා නින්ද ට ගියෙමු.

පසුව දා මා උදේම අවදි වී ලොකු අම්මාගේ තේ කෝප්පයක රස බලමින් සිටින විට ලොකු අප්පච්චි කුඹුරට යෑමට සූදානම් වුණා. එවිට මාත් ඔහු සමඟ කුඹුරට යෑමට එක් වුණෙමි. එත් සමඟම නතාරි, සදෙව්, චූටි, මල්ලි සහ යසස් අයියා සියලු දෙනා ම අවදි වී සිටි බැවින් ඔවුන් ද මා සමඟ එක් වුණා. අපි සියලු දෙනාම කුඹුරේ බැස හොඳට සෙල්ලම් කළා. දැඩි සුළං තිබුණු බැවින් අපි සරුංගලක් සාදා එය අහසට යැව්වා. හුඟක් විනෝද වුණා. එවිට ලොකු අප්පච්චි අප සියලු දෙනාටම අඬ ගසා කුඹුර අසල පිහිටි දොරක් පෙන්වා එය ඇතුළට යන්න එපා යැයි පවසා සිටියා. මට මේ ගැන

කුතුහලයක් ඇති වුණා. මම ලොකු අප්පච්චිගෙන් ඇයි දැයි විමසූ විට එය කීමට සුදුසු නැහැ යැයි පැවසුවා.

පසුවදා ද උදේම කුඹුරට යන විට මා දුටුවේ අපූරු දෙයකි. ඒ පිළිබඳ මා ලොකු අප්පච්චිගෙන් විමසා සිටියා. ඒ මුදු කිහිපයක් දමා තිබුණු කළයකි. එය පෙන්වා ලොකු අප්පච්චි ඒවා අල්ලන්න එපා යැයි පැවසුවා. මම නැවතත් ඔහුගෙන් ඇයි දැයි විමසා සිටි නමුත් ඔහු පැවසුවේ එය ද කීමට සුදුසු නොවන වගයි.

ඉන් පසු අප සියලු දෙනාම නිවස වෙත දිව ගියේ බඩගිනි වූ නිසාය. දවල් අහාරය ගත් අප නැවත කුඹුර වෙත ගියේ තව බොහෝ වෙලා සෙල්ලම් කිරිමේ අටියෙනි. ටිකෙන් ටික අඳුර වැටීගෙන එයි. තවත් වේලා කුඹුරේම සිටිමට ආස වුනත් කලුවර වු නිසා අපි ගෙදර ආවෙමු. ලොකු අම්මා ඉඳිආප්ප සමඟ පොල් කිරි හොඳි සහ මිරිස් ගලේ සම්බෝල අඹරා රස පාටට කෑම මේසය සූදානම් කොට තිබුණි. ඇඟ සෝදා ගත් අපි කෑම මේසයේ වාඩි වී රාත්‍රී ආහාරය භුක්ති වින්දෙමු. මම ඉන් පසු එළියට ආවා. මාත් සමග යසස් අයියාත් නංගිලා දෙන්නත් මල්ලිලා දෙන්නත් ආවා. අපි සවස සෙල්ලම් කරන විට කථා වු පරිදි කුඹුරට ගොස් ''ටෝච්'' එළියෙන් කුඹුරේ දොර සොයා යමු යැයි පැවසුවෙමු. ඉන්පසු යසස් අයියා කිවුවා 'අපි කොයිකටත් අපේ තාත්තා කිව්ව මුදු කළයේ තියෙන මුදු එක ගානේ දාගෙන

ඇතුල ට යමු' කියලා මමත් එයට එකඟ වුණා. අපි මුදු දාගෙන දොර ඇරීමට උත්සහ කරා. එත් දොර ඇරීමට නොහැකි වුණා. අපි නැවත ගෙදර ඇවිත් නින්දට ගියා. පසුවදා අම්මයි ලොකු අම්මයි අට්ටාලය සහ අල්මාරිය අස් කරමින් සිටිය දි මමත් ගිහින් උදව් කරා.

මම අල්මාරිය අස්කරන විට වහලා තිබුණු පෙට්ටියක් හම්බ වුණා. මම අම්මයි ලොකු අම්මයි යනකම් හිටියා. එයාලා ගියාට පසු මම ඒ පෙට්ටිය ඇරලා බැලුවා. එය ඇතුලේ අමුතු විදිහේ පොතක් තිබුණි. මම එය කියවන විට කුඹුරේ තිබෙන අභිරහස් දොර ගැන තොරතුරක් ලැබුණා. මම ඒ පොත මල්ලකට දාගෙන ටෝච් එකත් සමඟ මල්ලක් ලෑස්ති කර ගත්තා. මම මේ ගැන යසස් අයියාට කිව්වා. එයා මේ ගැන නංගිලා මල්ලිලාටත් කියමු කියලා කිව්වා. මාත් ඒකට කැමති වුණා. අපි ආයෙත් කලින් වගේම රෑ කෑමෙන් පසු කුඹුරට යන්න සූදානම් වුණා. රෑ කෑමෙන් පසු අපි එළියට ආවා. මම ගොස් පොතේ තිබුණු අයුරින් කළේ තිබුණු මුදු හය දොරේ මැද තිබුණු මල් හැඩයේ යතුරු හිලට සුදුසු අයුරින් මුදු එක බැගින් දැම්මා. එවිට එය කැරකී දීප්තිමත් එළියක් ආවා. එක පාරමට දොර ඇරුණා. මම පොතේ තිබුණු විදිහට මුදු දාගන්න අවශ්‍ය වු බැවින් හැමෝටම මුදු එක බැගින් නැවත දාගන්න කියමින් ඇතුලට ගියා. මම මගේ සහෝදර සහෝදරින් සමඟ

ඉදිරියට ගියා. මම ටෝච් එක පත්තු කර රෑ ගත කිරීමට තැනක් හෙව්වා.

එක පාරටම එක මනුස්සයෙක් අශ්වයාගේ පිටේ ඇවිත් අපිව රැගෙන ඉදිරියට ගියා. පසුව ගෙදරකින් අශ්වයාව නවත්වා දොරට තට්ටු කළා. දොර ඇරුණා. අපිව ඇතුලට ගත්තා. මම හිතුවේ අපට කරදරයක් කරන්න යනවා කියලා. එත් ඒක එහෙම වුණේ නෑ. මගෙන් එයා ඇහුවා ඔයාලා කොහේ ඉඳන් ද ආවේ කියලා.

එතකොට මට තේරුණා අපි වර්තමානයේ සිට අතීතයට ඇවිත් කියලා. මම කිවුවා ඔහුට අපි ආවේ වර්තමානයේ ඉඳන් කියලා. ඔහුට මම කිව්ව දේ තේරුණා කියලා නම් මම හිතන්නේ නෑ. එයා අපිව උඩ තට්ටුවට රැගෙන ගොස් සුවපහසු ඇඳක් සහිත කාමරයක් පෙන්නුවා. අපිට ඇතුලට යන්න කීවා. අපි සියල්ලෝම  ඇතුලට ගියා. අනිත් අය සැපට හා මහන්සියට නිදා ගත්තත් මට නම් නින්ද ගියෙම නෑ. මම මේ ගැන අසල තිබුණු පුටුවක වාඩිවී  මේ ගැන දිගින් දිගටම කල්පනා කළා. කල්පනා කරන විට මට හිතුණා අර දොර තමා අපිව අතීතයට ගෙනාවේ කියාලා. මට අර මනුස්සයාව දැකලා පුරුදුයි කියලා හිතුණා. අද හවස ලොකු අම්මලාගේ ගෙදර අස්කරද්දි ''ඇල්බම්'' එකක් තිබිලා අම්මා මට පින්තූරයක් පෙන්වා මේ මගේ මී මුත්තා කියා පහදා දුන්නා. එවිට ''අනේ දෙවියනේ ''

අපි මේ ඇවිල්ලා ඉන්නේ මගේ මී මුත්තලා දිහාට කියා මට හිතුණා. මම නිදා සිටි යසස් අයියාව ඇහැරවා මේ ගැන කිවුවා එයාත් පුදුම වුණා. එයයි මමයි නංගිලාවත් ඇහැරවා ගත්තා. මම එය කියලා ඉවරුවනකොටම අපි කොහොම ද යන්නේ කියලා යසස් අයියා ඇහුවා. මම ටිකක් හිතුවා. මට මතක් වුණා මෙහි දි දැකපු අශ්ව ගාල. අපි අශ්වයන්ගේ පිටේ යමු කියලා මම කිවුවා. අපි කාමරයෙන් එළියට ඇවිත් දොරට තට්ටු කළා. දොර ඇරුණා. අපි අශ්ව ගාලට ගොස් අශ්වයන්ගේ පිටේ නැගලා එයින් පැන ගත්තා. දැඩි සුළඟක් හැමුවා. අශ්වයාට තවත් යන්න බැහැ මහන්සි කියලා දැනුණා. මම අශ්වයා ව අසල ගසකින් ගැට ගසා පිටුපස බැලුවා. හැමෝටම නින්ද ගිහින් මමත් නිදා ගත්තා.

පසුවදා අපි නැගිටිද්දි හොඳටම උදේ වෙලා. මම ඇස් ඇරලා බලන විට ලස්සන දිය ඇල්ලක් තිබුණා. මම පොත බැලුවා. වර්තමානයට යන්න ක්‍රමයක් හොයන්න. එවිට මට හිමඳු මල්ලි බඩගිනි කිවුවා. මම ලොකු අම්මලාගේ ගෙදරින් අරන් ආපු කෑම වගයක් තිබුණා. මම ඒවා ටික කට්ටියටම බෙදා දී පොත පෙරලුවා. පේන විදිහට අපි ඉන්න දිය ඇලි ගාවින් තිබෙන ගුහාවට ගොස් යෝධයාගෙන් යතුර ගන්න ඕන. ඒක ඇහිලා යසස් අයියා ඒක හොඳටම භයානකයි කියලා කිවුවා. ඒත් ඒක තමයි අපට ගෙදර

යන්න තිබෙන එකම විදිහ කියලා මම කිවුවා. මම සහොදරයොත් සමඟ ගුහාවට ගියා.

යෝධයා දිගු නින්දක හිටියේ. එක පාරටම යෝධයාගේ ඇඟට එයාගේ සුරතලා පැන්නා. මහා හඬින් යෝධයා ''බී බයි බෝ බම් මට මිනිස් සුවඳක් එනවා '' කියමින් කියා කෑගහමින් යෝධයා වේගයෙන් නැඟිට්ටා. අපි හැමෝම මල් පෝච්චියක් පිටුපස හංගුණා. ඉන් පසු යෝධයා මුළුතැන් ගෙට ගොස් මේසය මත තිබු කෑම කෑවා. ඒ අතර තුරේ මම දැක්කා යතුර යෝධයා නිදා සිටි පුටුව මත තියෙනවා. මම ඉක්මනින්ම හැංගි සිටි පෝච්චියෙන් එළියට ඇවිත් අමාරුවෙන් පුටුවට නැග්ගා. යතුර ටිකක් විශාලයි. මම එය අමාරුවෙන් උස්සාගෙන ආවා. මම සහෝදරයින්ට කිවුවා ''යතුර ගත්තා යමු'' කියලා. අපි යන්න හදන කොටම යෝධයා ආවා. ඔහුට යතුර වැටිලා කියලා ගානක්වත් නෑ. ඒ අතරතුරේ අපි අතින් මල්පෝච්චිය පෙරලුණා. එයින් මහා හඬක් නිකුත් වුණා. ඒ ශබ්දයට නැගිට්ට යෝධයා අපව දැක්කා. යෝධයා වේගයෙන් අප දෙසට දිව ආවා. අපි එතනින් ඉක්මනින් පැනලා ආවා. අශ්වයා පිටේ නැග්ගා. එක පාරටම අශ්වයා පියාඹන්න පටන් ගත්තා.

මට හරි පුදුමයි. ඒකත් හොඳට වෙන්න ඇත්තේ කියලා මට හිතුණා. මම නැවතත් පොත පෙරළා ඊ ළඟට කුමක් කළ

යුතු දැයි බැලුවා. පොතේ සඳහන් ව තිබුණේ රන් ඇපල් ගසක් ළඟ මීයෙක් ඉන්නවා. ඌට රන් ඇපල් ගෙඩියක් දී කියන්න අවශ්‍ය වී තිබුණේ දොර පෙන්වන්න කියලා යි. කෙසේ හෝ අපි රන් ඇපල් ගස සොයා ගත්තා. ගහේ මුල අසල කුඩා ගුලක මීයා සිටියා. මම ඌට රන් ඇපල් ගෙඩියක් කඩන්න ගිය විට එක් උයන්පල්ලෙක් එතනට ඇවිත් අපව එළවා දැමුවා. මම ඇහුවා යසස් අයියාගේ දැන් අපි මොකද කරන්නේ කියලා. මට අදහසක් ආවා. අසල ගසක් යට දුන්නක් සහ ඊතලයක් තිබුණා. රන් ඇපල් ගෙඩියක් ඉලක්ක කර ඊය විද්දා. ඇපල් ගෙඩිය මීයාගේ ගුල ගාවට වැටුණා. මීයා ඉක්මනින් ගුලෙන් එළියට ඇවිත් ඇපල් ගෙඩිය ගත්තා. ඌ එය කාලා කවුද මේ ඇපල් ගෙඩිය දුන්නේ කියා විමසුවා. එවිට මම අසුපිටින් බැහැලා මමයි කියලා කීවා.

මම ඌට කිවුවා ''අපිට මෙහේ තිබෙන දෙර පෙන්වන්න පූළුවන් ද කියලා. ඊට පස්සේ ඔහු රන් දොරක් හා පරණ දිරච්ච දූවිලි පිරුණ ලී දොරක් පෙන්නුවා. ඉන් පසු ඌ අපට අවවාදයක් කරා. ''ඔබලා ලස්සන සහ වටිනාකම් ගැන හිතන්න නම් එපා කියලා'' මම වැඩිය ඒක හිතට ගත්තේ නෑ. මම කට්ටියටම අශ්වයාගේ පිටෙන් බැහැලා එන්න කිවුවා. කට්ටියම ආවා. මම ඇහුවා යසස් අයියාගෙන් අපි මොන දෙරෙන්ද යන්නේ කියලා. එයා රන් දොරෙන් යමු කීවා. මට

මීයා කියුපු එක අමතක වුණා. මමත් රන් දොරෙන් යන්න එකඟ වුණා. ඉන් පසු යෝධයාගේ ගුහාවෙන් ගත්ත යතුරෙන් දොර ඇරියා. එවිට පොත මගේ අතින් අත හැරුණා. අපි දොරනේ ඇතුළට ගියා. එවිට මම හිතුවේ අපි ගෙදර ආවා කියලා. එහෙත් එය එහෙම වුණේ නැහැ. අපි ඇස් අරලා බලද්දි අපි ඇවිල්ලා තිබුණේ අමුතුම තැනකට.

මම පොත හෙව්වා. හම්බවුණේ නෑ. මට මතක් වුණා පොත දොර ගාව වැටුණා කියලා. මම බය වුණා. මම හිතුවේ ගෙදර යන්න බැරි වෙයි කියලා. එවිට යසස් අයියා කිවුවා බය වෙන්න එපා නංගි කියලා. මගේ හිත ටිකක් හැදුණා. මම වට පිට බැලුවා. අතීතයට වඩා නම් හොඳයි. මට තේරුණා අපි ඇවිත් ඉන්නේ වර්තමානයට නෙවෙයි නම් අනාගතයට කියලා. අපි ඇවිල්ලා තිබුණේ මුහුදු වෙරළක් අසලට. නතාරි නංගි මට කිවුවා අර ලොකු ගස ළඟ විවේක ගමු කියලා. එවිට හැමෝම විවේක ගන්න ගියා. මම හැමෝම නිදා ගන්නකම් ඉඳලා වෙරළ දිහා බලා ගෙන සිටියා.

මට මිහිරි හඬක් ඇසුණා. මුහුදෙන් දිග වරලකුත් පෙණුනා. මම වෙරළ ගාවට දුව ගියා. ලස්සන දිය කිඳුරියක් ගලක් මතට වී සිංදු කියනවා. ඇය මාව දැක්කා. මට අඬ ගසා මෙසේ කිවුවා. '' ඇයි ඔබ හැංගිලා . මෙහේ එන්න'' අනේ කිඳුරිය අපි ආවේ කුරුණෑගල ඉඳන් ඒ කොහෙද කියලා ඔබ දන්නේ

නෑ කිඳුරිය. එබට මායා බලයක් තිබේද ?. මම විමසුවා. ඇය ඔව් කියා මාව වාත බුබුලක දමා මුහුදු පතුලට ගෙන ගියා. මායා බෝලයක් ගෙන අමුතු වචනයක් කියා අප ඉන්න දිහාව දැන ගත්තා. ඇය අනුකම්පාවෙන් මා දිහා බලා මෙහෙම කිවුවා. '' අනේ මගේ දරුවෝ ඔයාලා ඇවිත් ඉන්නේ අනාගතයට නේද? කියලා. මම අපිට උදවු කරන්න පුලුවන් ද කියලා ඇහුවා. ඇත්තටම පුළුවන් කියලා මාව ඇතුලට රැගෙන ගිය වාත බුබුල ඉවත් කර ඇය මනුස්සයෙක් බවට හැරුණා. ඇයත් අප සමඟ යන්න පැමිණියා.

ඇය වර්තමානයට යන්න උදවු කරයි කියලා මම හිතනවා. කිඳුරිය කරත්තයක් ගෙන්වා අප සියල්ලන්ටම නඟින්න කිවුවා. අපි නැග්ගට පස්සේ කරත්තය වේගයෙන් අහසට නැග්ගා. මම කිඳුරියට පොත හා මීයා ගැන පැහැදිලි කරා. වාසනාවට කිඳුරිය අප වර්තමානයට යවන හැටි දැන සිටියා. ඇය, ඇය ගැන විවිධ දෑ කියමින් සිටිය නිසා මගේ වෙහෙස නිවුනා. වර්තමානයට යන්න පුළුවන් වෙයි කියලා හිතුණා. දන්නෙම නැතුව අපි බිමට ඇවිත් සිටියා.

කිඳුරිය අපට අලංකාර රිදී කන්දක් පෙන්නුවා. එය හිරු එළියට දිලිසෙනවා. ඉතාම අලංකාරයි. ඇය මට කිවුවා. ''ඔබලා මේ කන්ද නැගලා නිදි මකරාව අවදිකර ඌ සමඟ සටන් කර ඌව පරදා ඔබලාට උදවු කරන්න කියන්න කියලා.

ඉන් පසුව මම ඈයට ස්තුති කර සහෝදරයන් සමඟ කන්ද තරණය කරන්න යන කොටම කිඳුරිය නැවතත් කථා කර '' මේ කඩුව ගන්න මකරාව පරදන්න උදව්වෙයි. කියලා ඌගෙන් ඔබ උදවු ඉල්ලුවාම මකරා අසාවි මොකක්ද උදව්ව කියලා. එවිට ඔබ කියන්න මකරෝ ඔබේ බෙල්ලේ තියන මුද්ද දෙන්න කියලා ඊට පස්සේ මං මේ දෙන කෙස් මිටි ගෙන ඉන් ගැට ගසා ගන්න එය ඔබලා ව අනතුරු වලින් ආරක්ෂා කර හරි තැනට රැගෙන යාවි කියමින් කිඳුරිය අපෙන් සමු ගත්තා. අපි ඇයට අත වනා කඹයක් ගෙන බොහොම අමාරුවෙන් රිදී කන්ද නැග්ගා. අපි මකරාව හොයා ගත්තා. ඒත් එය ලේසි වුණේ නෑ. මකරාව හොයා ගත්තාට ඇහැරවන්න ක්‍රමයක් තමා නැත්තේ නතාරි නංගි කිවුවා.

එක පාරටම කිඳුරියගේ කෙස් මිට කථා කරන්න ගත්තා. මට පුදුමත් හිතුණා. එහෙත් කෙස් මිට මකරා ඇහැරවන්න උපායක් කීවා. අපි කෙස් මිට කිවුව විදිහට ලොකු රිදී ගලක් ගෙන මකරාට ගැහුවා. මකරා කේන්තියෙන් අවදි වුණා. එවිට කෙස් මිට කීවා , යන්න දිනිති දැන් ඔයා කඩුව ගෙන ඉදිරියට යන්න කොයිම වෙලාවකවත් බය වෙන්න එපා'' මාව මෙතන ඉන්න වැඩිමලාට දීලා යන්න කියලා'' මම කෙස් මිට යසස් අයියාට දී මකරා ගාවට ගියා. මකරත් කඩුවක් ගෙන සිටියා. මම කෙළින්ම මකරාගේ අත කැපුවා. එවිට ඔහු

අතින්  කඩුව වැටුණා. ඔහු හුඟක් බිය වුණා. ගුහාවෙන් පිට සිටි සහෝදරයෝ ගුහාවට ආවා.  කෙස් මිට මගේ සාක්කුවට ආවා. ඉන් පසු කෙස් මිට  '' මකරාට බෙහෙත් දමා  කීකරු කර ගන්න කිවුවා මම නැවතත් කෙස් මිට යසස් අයියාට දී මකරාගේ අත වෙලුම්  පටියකින් එතුවා.

ඉන් පසු මකරා මට ස්තූති කරා.  මම මකරාට කීවා  අපිට උදවු කරන්න කියලා.  ඉතින් මකරා මොකක්ද කියලා ඇහුවා. මම කිඳුරිය කිව්ව මුද්ද ඉල්ලුවා.  මකරා ඒක එකපාරටම දෙන්න කැමති වුණේ නෑ.  නමුත් ඌ ඒක දුන්නා.  අපි මකරාගේ පිටේ නැග්ගා.  මකරා වේගයෙන් අහසට නැග්ගා.  එවිට කෙස් මිට කිවුවා.'' තව ටික දුරක් යද්දි  රන් මුතු පිරිච්ච  ගස් හම්බවෙයි. ඒවා දිහා බලන්නේ නැතුව  දිගටම යන්න.  ඒවා මිරිඟුවක් නිසා ඒවා දිහා බලන්නවත් එපා කියලා. මුදු හැඩයේ රන් දොරකුයි පරණ ලී දොරකුයි හම්බවෙයි.  වැඩිය ලස්සන වටිනාකම ගැන හිතන්න එපා. '' කියා  කෙස් මිට අතුරුදහන් වුණා.

මම මේ පාර නම් කෙස් මිට කිවුව දේ හිතට ගත්තා. රන් රිදී තිබුණ තැනට   අපි ආවා.  මම මකරාට වේගයෙන් යමු කීවා.   අවසානයේ මම දෙරවල් දෙක  දැක්කා.  මම ඉක්මනින්  මකරාව පහලට යැව්වා. අපි හැමෝම බිමට බැස්සා. මම මකරාට ස්තූති කර යන්න කීවා.  ඉන් පසු  මම ලස්සන වටිනා දොර නැතුව  ලී දොරට මුද්ද සවි කළා.  එවිට දොර

ඇරුණා. අපි සියල්ලෝම එකට දොර ඇතුලට ගියා. අපි ඇස් පියාගෙන හිටියා. අපි ඇස් ඇරින විට අපි හිටියේ ලොකු අම්මලාගේ කුඹුරේ. අපි වේගයෙන් ගෙදර වෙත දිව යන විට ලොකු අම්මලා අපිව හොයමින්නුයි සිටියේ. අපිට ගොඩක් සතුටු හිතුණා.

ලොකු අම්මලාත් මිදුලේ සිටි බැවින් අපි ඔවුන් ව වැළඳ ගත්තා. කොහෙද දරුවනේ ඔයාලා අතුරුදහන් වුණේ කියලා විමසා සිටි නමුත් අප ගිය ගමන ගැන ඔවුන් විශ්වාස නොකරයි කියා මට හිතුණ බැවින් අපි සෙල්ලම් කර කර සිටි බව පවසා රෑ කෑම ගැනීමට සූදානම් වුණා. නමුත් මම අම්මාට අපට සිදු වුණු සියලු දේ පැවසුවා. අම්මා කීවා ඒක නම් සුරංගනා කථාවක් වගේ කියලා.

ඔහොම තමයි අපේ කුඹුරේ තිබුණු දොරෙන් අපි එළියට ආවේ.

* * * * *

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි.

ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් වත් ලබා දිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් දරුවන් දුරස්වීම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධ මේ වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේම මාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවි බල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේම මාලා කුමරියට දැක්වීමද මෙහි මූලික අරමුණයි. මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, , විදුහල්පතිනිය, ගුරු, භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද් කාර්යය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

ව්‍යාපෘති නිර්මාතෘ

ISBN No:978-624-211-275-6